# ලියෝ සමාජයේ නිලධාරීන් ස්ථාපනය කිරීම

අද දින ලියෝ සමාජයේ නිලධාරීන් ස්ථාපනය කිරීමට සහ එම කර්තව්‍යය මා වෙත පැවරීම පිළිබඳවද ස්තුතිවන්ත වන අතර මා විශ්වාස කරනවා, මෙම ලියෝ සමාජයේ එම සාමාජිකත්වය තම තමන් පත්වූ තනතුරේ කාර්යභාරය හරියාකාරව කරගෙන යයි කියා. ඒ එක එක්කෙනා එම තනතුරේ ස්ථාපනය කිරීමේ කටයුතු කරනු ඇති හෙයින් පූර්ණ නිශ්ශබ්දතාවය රැකගන්නා මෙන් ඉල්ලා සිටිමි.

## 01. සියලුම අධ්‍යක්ෂ මණ්ඩලය

මෙම ලියෝ සමාජයේ අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් ඔබ සියළුදෙනා තෝරා පත්කර ඇති හෙයින් ඔබ මෙහි විධායක අධ්‍යක්ෂවරුන් වශයෙන් නිරතුරුව මෙම අධ්‍යක්ෂ මණ්ඩල ර◌ුස්වීම් හා අනෙකුත් රැස්වීම් වලට සහභාගි විය යුතුයි. නිලධාරී මණ්ඩලයත් සමඟ නිසි ලෙස ගෙවීම් සොයාබලා කටයුතු කිරීමත්, ආදායමට වඩා වියදම් වැඩි නොවීමට කටයුතු යෙදීමත් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වේ. ඒ වගේම අනවශ්‍ය වියපැහැදම් සඳහා අනුමැතිය දිය යුතු නොවේ. ඔබලා සභාපතිවරයාට පූර්ණ සහයෝගය දීමට බැඳී සිටීමටද, තම වගකීම් පිළිගැනීමටද කැමැත්තෙහිද?

ඔව්. අපි එසේ කරමු.

## 02. ලියෝ භාණ්ඩාගාරික

ඔබ මෙම ලියෝ සමාජයේ භාණ්ඩාගාරික වශයෙන් තෝරා පත්කර ඇති අතර ලියෝ සමාජයේ මුදල් නිසි පරිදි බැංකු වල තැන්පත් කරන බවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය පරිදි මුදල් පරිපාලනය සඳහා වියදම් කළ යුතු බවත්, මාසිකව හා වාර්ෂිකව ඔබ ලියෝ සමාජයේ ආදායම් වාර්තා ඉදිරිපත් කරන බවත්, ඔබගේ සම්පූර්ණ සහාය ලියෝ සමාජයේ සභාපතිටත් අධ්‍යක්ෂ මණ්ඩලයටත් උපදේශකත්වයටත් ලබාදෙන බවත්, මෙහිදී සියළුදෙනා ඉදිරියේ පොරොන්දු වන්නේද?

ඔව් මා එසේ කිරීමට පොරොන්දු වෙමි.

## 03. ලියෝ සමාජයේ ලේකම්

ඔබ මෙම ලියෝ සමාජයේ ලේකම් වශයෙන් පත්කරන ලද අතර ඔබ සභාපතිතුමාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ මෙම ලියෝ සමාජයේ සියළුම වාර්තා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තා, කමිටු වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර ඔබ සාමාජිකයින්ගේ පැමිණීමේ ලැයිස්තු සකස්කිරීමත්, මාසික ලියෝ සමාජ ප්‍රගති වාර්තාව මෙන්ම වාර්ෂික වාර්තාව යැවීමත් කළ යුතුයි. ඒ වාගේම ඔබ ලියෝ සමාජය ඉදිරියට

ගෙනයාමට කටයුතු කිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම ලියෝ උපදේශකත්වය සමඟ ඉතා සුහදව කටයුතු කිරීමටත් පොරොන්දු වන්නෙහිද?

ඔව් මා එසේ කිරීමට පොරොන්දු වෙමි.

## 04. ලියෝ උපසභාපති

ඔබ මෙම ලියෝ සමාජයේ උප සභාපති වශයෙන් පත්කරගෙන ඇති අතර යම් හෙයකින් සභාපති නොපැමිණි හැම මොහොතකම ලියෝ සමාජයේ මුලසුන හෙබවිය යුතුයි. ඔබට ඒ අවස්ථාවේදී සභාපතිතුමාගේ සියළු බලතල ලැබෙන අතර සභාපතිතුමාගේ අනුදැනුම මත ඔබ ඉතාමත් සුහදව අනෙකුත් සාමාජිකයන් සමඟ කටයුතු කළ යුතු අතර ඔබගේ මව් සමාජය වන සිංහ සමාජය සමඟද ඉතාමත් සුහදව එකම පවුලක් ලෙස කටයුතු කළ යුතුයි. ලියෝ උපදේශක සමඟ කටයුතු කරමින්, සහයෝගය දෙමින් පරිපාලනය මෙන්ම ලියෝ සමාජයේ ව්‍යාපෘතිද ඔබ මැදිහත් වී කළ යුතු වේ. ඔබ උප සභාපති වශයෙන් මෙම ඉදිරි වසරේ ඔබගේ කාර්යභාරය හරියාකාරව කිරීමට එකඟ වන්නේද?

ඔව් මා එසේ කිරීමට පොරොන්දු වෙමි.

## 05. ලියෝ සභාපති

මෙම ලියෝ සමාජයේ සභාපති වශයෙන් මෙන්ම ප්‍රධාන විධායක වශයෙන්ද තෝරා පත්කරගෙන ඇති ඔබ ඔබගේ බලය පාවිච්චි කිරීමේදී ලියෝ සමාජයේ සියළු සාමාජිකයන්ගේ එකමුතුව රැකෙන පරිදි කටයුතු කළ යුතු අතර ඔබගේ මව් සමාජය හා උපදේශක සමඟ ඉතාමත් කිට්ටුවෙන් කටයුතු කළ යුතුය. ඔබ ලියෝ සමාජයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු අතර එසේම ව්‍යාපෘති කරගෙන යාමට අනෙකුත් ලියෝ පෝතකයන්ට බලය පැවරීම තුළින් ලියෝ සමාජය තුළ නායකත්වය ගොඩනැගීමට කටයුතු කළ යුතුයි. ඒ වගේම ඔබ ලියෝ සමාජයේ සේවය ලැබිය යුතු අයට සේවය කිරීමටද ලියෝ පෝතකයින් උද්යෝගිමත් කරවීම සඳහා ඔවුනට ධෛර්යය ලබාදීමද කළ යුතුයි. ඔබ මෙම ලියෝ සමාජයේ සභාපති වශයෙන් වගකීම භාරගන්නේද?

ඔව්. මම වගකීම භාරගනිමි.